Department of Education, Sabaragamuwa Province/ Weekly School

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව - සති පාසල

විෂය : ගණිතය

සතිය : 27 – 2 වාරය


ශ්‍රේණිය :6

නම/ විභාග අංකය : .................................................................. පන්තිය : .........................

ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

## I කොටස


1) පැකට්ටුවේ ඉතිරිව ඇති චොකලට් බෝල ගණන 16 ක් නම් පැකට්ටුව සම්පූර්ණයෙන් පිරී ඇති විට චොකලට් බෝල කොපමණ ඇත්දැයි නිමානය කරන්න.



2) දී ඇති සංඛ්‍යා අතරින් ප්‍රථමක සංඛ්‍යා තෝරා ලියන්න ..............................................

1, 2, 4, 5, 8, 9, 10

3) 8395100 සම්මත ආකාරයෙන් ලියා සංඛ්‍යා නාමය ද ලියා දක්වන්න.


4) 


ජලය හා පළතුරු යුෂ එක් කර සෑදිය හැකි පළතුරු බීම ප්‍රමාණය ලීටර හා මිලිලීටරවලින් ප්‍රකාශ කරන්න.

5) $\frac{3}{8}$ ට තුල්‍ය වූ භාග දෙකක් ලියන්න.

6) සවින්දිගේ උපන් දිනය 2009 වර්ෂයේ අප්‍රේල් මස හය වන දින නම් එම දිනය සම්මත ආකාරයෙන් ලියන්න.


7) අංක මඟින් දක්වා ඇති කෝණ කුමන වර්ගයට අයත් වේද?




1 කෝණය ......................................
2 කෝණය ......................................

8) දී ඇති සංඛ්‍යා රේඛාව මත පහත සංඛ්‍යා සලකුණු කර අදාල අක්ෂරය යොදන්න.

A = 4
B = -2
C = 0
D = -3




9) පහත දැක්වෙන සමූහ දැක්වීමට සුදුසු නාම ලියන්න.

| 1 3 10 15 6 |
|---|


........................................

| ½ $^{1}/_{6}$ $^{1}/_{11}$ $^{1}/_{5}$ |
|---|

................................................

10) 9 හි සාධක දෙකක් ලියන්න.

11)




මෙම පතරොම භාවිතයෙන් සෑදිය හැකි ඝන වස්තුවේ දාර ගණන හා ශීර්ෂ ගණන වෙන වෙනම ලියන්න.

12) පළතුරු පැල 4 බැගින් නිවාස 352 කට බෙදා දීමට පැල කීයක් අවශ්‍ය වේද?

13) සියලු පාද දිගින් සමාන වන තලරූප මොනවාද?

සමාන්තරාස්‍රය, සමචතුරස්‍රය, ත්‍රපීසියම, රොම්බසය, ඍජුකෝණාස්‍රය

14) මෙම රටාවේ ඊළඟ අවස්ථාව අදින්න.




..........................................

15) $\frac{1}{2} + \frac{3}{8}$ අගය සොයන්න.

16) තිසරගේ නිවසට දකුණු දිශාවෙන් පාසල ද පාසලට නැගෙනහිර දිශාවෙන් ධනංජයගේ නිවසද පිහිටයි. ඒ අනුව තිසරගේ නිවසේ සිට කුමන දිශාවෙන් ධනංජයගේ නිවස පිහිටයි ද?

17)




සංඛ්‍යා රේඛාව ඇසුරින් < හෝ > අසමානතා ලකුණු නිවැරදිව යොදන්න.

-3 ....... -2　　　　　-2 ........ 3

18) $\frac{37}{100}$ දශමස්ථාන භාවිත කරමින් ලියන්න.

19) ආයතනයක් දිනකදී රසකැවිලි 5693 ක් ද පසු දින රසකැවිලි 4987 ක් ද නිපදවයි. පෙර දින කොපමණ රසකැවිලි ප්‍රමාණයක් වැඩිපුර නිපදවූයේ ද?

20) සෘජුකෝණාස්‍රයේ පරිමිතිය සොයන්න.

